# සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය - රුවන්වැල්ල

# අයදුම්පත් කැඳවීම

සීමාසහිත රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා සමිති බල ප්‍රදේශයේ ප්‍රමුඛතා අනුපිළිවෙලට කෑගල්ල දිස්ත්‍රික්කයේ වසර දෙකක ස්ථිර පදිංචි, වයස අවුරුදු 18 ත් - 45 ත් අතර (සමුපකාර සමිතිවල දැනට සේවය කරන අයට වයස් සීමාව බලපාන්නේ නොලැබේ) අයදුම්කරුවෙන්ගෙන් අයදුම්පත් 2026.07.06 දින දක්වා කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **තනතුර** | : | **ක්ෂේත්‍ර නිලධාරී (මෙහෙයුම් 1A ශ්‍රේණිය)** |
| **වැටුප් ක්‍රමය** | : | රු. 33,500 - 10 X 240.00 - 10 X 250.00 = 38,400.00 |
| **පන්තිය** | : | III |
| **පුරප්පාඩු සංඛ්‍යාව** | : | 02 |

**සුදුසුකම් :**

I. අ.පො.ස. උසස් පෙළ වාණිජ අංශයෙන් සාමාර්ථය ලබා තිබීම,

හෝ

II. අ.පො.ස. සාමාන්‍ය පෙළ වාණිජ විෂය සහිතව සමත් වීම සහ සමුපකාර සාමාන්‍ය පෙළ සමත්වීම

හෝ

III. ශාඛා කළමනාකරු හෝ ලිපිකරු තනතුරක වසර 05 කට වැඩි සතුටුදායක සේවා කාලයක් තිබීම

හෝ

IV. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ ජාතික (උසස් පෙළ) සහතිකය ලබා ්තිබීම හෝ සබරගමුව විශ්වවිද්‍යාලයේ සමුපකාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව උසස් ඩිප්ලෝමාව ලබා තිබීම හෝ පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**සැ. යු :**

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ සමග අදාල සහතිකනවල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට විවිධ සේවා සමුපකාර සමිතියක සේවය කරන අයෙකු අයදුම්කරන්නෙක් නම් එම සමිතියේ මෑතකදී ලබාගත් සේවා සහතිකයේ පිටපතක් සහ ඉල්ලුම් කරන තනතුරට ඔබව තෝරාගත හොත් දැනට සේවය කරනු ලබන සමිතියෙන් නිදහස් කරන බවට සමිතියෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත සමිතියේ සභාපතිතුමා මගින් නිර්දේශ කර එවිය යුතුය.

පිරිමි අයෙකු සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

යතුරු පැදි ධාවනය සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් අවශ්‍ය වේ.

මනා දක්ෂ කාර්යශූර, සෞඛ්‍ය සම්පන්න අයෙකු විය යුතුය.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාම සේවා සහතිකය, චරිත සහතික දෙකක්, හැඳුනුම්පත, පළපුරුද්ද පිළිබඳ සහතිකය, සේවා සහතික සහ වෙනත් සුදුසුකම් සහතිකවල ඡායා පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලිපිකවරයේ වම්පස් ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය.

**"ගරු සභාපති, සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය, රුවන්වැල්ල."**

**ගරු සභාපති,**
**සී/ස රුවන්වැල්ල වි.සේ.ස. සමිතිය, රුවන්වැල්ල.**
**2026.06.22**
**036-2266392 / 0362267345**